# කොළඹ විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව
## පුරප්පාඩු (කොන්ත්‍රාත් පදනම මත)

කොළඹ විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා යෝග්‍ය සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

❖ වඩු කාර්මික (කොන්ත්‍රාත් පදනම මත)

අවම සුදුසුකම් :-

1. අටවන ශ්‍රේණිය සමත් විය යුතුය.
2. පහත කාර්යයන් කිරීමේ මනා පළපුරුද්දක් තිබිය යුතුය.
   (අ) ගොඩනැගිලි හා ගෘහ භාණ්ඩ කර්මාන්තය සම්බන්ධව වඩු වැඩවලදී පාවිච්චි වන නොයෙකුත් පිරිද්දුම් සහ පිරිවැද්දුම් සකස් කිරීම.
   (ආ) නොයෙකුත් අන්දමේ වඩු ආයුධ සහ නොයෙකුත් අන්දමේ දැව වර්ග පාවිච්චිය සහ සැලසුම් කියවීම.
   (ඇ) අඟලෙන් 1/32 දක්වා පරිමාණයන් නිවැරදිව කියවීම පිළිබඳ හැකියාවන් තිබීම.
3. වර්ෂ දෙකකට නොඅඩු පළපුරුද්දක් තිබීම.(සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය.)

මාසික වැටුප : රු.29,915/= + ජීවන වියදම් + රජයේ දීමනා + ETF + EPF
බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.
වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

❖ පෙදරේරු (කොන්ත්‍රාත් පදනම මත)

අවම සුදුසුකම් :-

1. අටවන ශ්‍රේණිය සමත් විය යුතුය.
2. පහත කාර්යයන් කිරීමේ මනා පළපුරුද්දක් තිබිය යුතුය.
   (අ) ගඩොල් බැම්ම, විවිධ මාදිලියේ ගඩොල් බිත්ති බැඳීමේ ක්‍රම භාවිතයෙන් බිත්ති පාදම, බිත්ති ආරුක්කු කණු, වීම්නි, මල අපවාහන, මනුබිල ආදිය නිර්මාණය.
   (ආ) සියලුම වර්ගවල කපරාරු සහ එහි මිශ්‍රණ, වැරගැන් වූ කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම හා දැමීම.
   (ඇ) සැලසුම් කියවීම හා සාමාන්‍ය ඉදිකිරීම් සඳහා සැලසුමට අනුව බිම් සකස් කිරීම හා නූල් ඇදීම.
   (ඈ) තීන්ත ආලේපනය සහ ඉමල්ෂන් තීන්ත භාවිතයෙන් පින්තාරු කිරීම.

3. වර්ෂ දෙකකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.(සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය.)

මාසික වැටුප : රු.29,915/= + ජීවන වියදම් + රජයේ දීමනා + ETF + EPF
බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.
වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**පොදු කොන්දේසි :-**

මෙම පත්වීම් කොන්ත්‍රාත් පදනම මත ආරම්භයේදී වසරක කාලයක් සඳහා ලබා දෙන්නක් වන අතර කොන්ත්‍රාත් කාලසීමාව තුළ ඉටුකරන කාර්යසාධනය පිළිබඳ සෑහීමට පත්විය හැකි නම් තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ කාලසීමාව වසර 2ක් දක්වා දීර්ඝ කිරීම පිළිබඳ සලකා බැලීමට විශ්වවිද්‍යාලයට හැකියාව තිබේ.
අදාළ අයදුම්පත් https://cmb.ac.lk/vacancies යන විශ්වවිද්‍යාල වෙබ් අඩවිය තුළින් බාගත කරගත හැකිය.

නිසි පරිදි පුරවන ලද අයදුම්පත් 2024.05.14 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අනධ්‍යයන ආයතන,කොළඹ විශ්ව විද්‍යාලය,අංක **94**,කුමාරතුංග මුනිදාස මාවත,කොළඹ **03** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ලබා තිබිය යුතු අතර එම සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීමට අදාල සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.(එසේ නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)එසේ ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කුමන හේතුවක් නිසාවත් නැවත සලකා බලනු නොලැබේ.

වැඩ බලන ලේඛකාධිකාරී
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03
2024.04.30